Annex "B1"

# 2016 වර්ෂය සඳහා සැපයුම්කරුවන් - කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පොදු උපදෙස්, නියමයන් හා කොන්දේසි ආරක්ෂක අමාත්‍යාංශය

1. 2016 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවි මගින් 2015.08.31 දින සිට 2015.10.16 දින දක්වා අය කිරීමකින් තොරව බාගත (Download) හැකිවේ.

2. සැමවිටම නිවැරදි තොරතුරු පමණක් සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ තොරතුරක් සාවද්‍ය බවට හෝ කවර හෝ වැදගත් තොරතුරක් ලබාදීමෙන් වැලකී සිටින බවට පෙනී යන්නේ නම් එවැනි අයදුම්කරුවෙකු ලියාපදිංචිවීම සඳහා සුදුසුකම් නොලබනු ඇත. අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. අයදුම්පතට ඇමිණිය යුතු සියලු ලිපි ලේඛන අනුක්‍රමිකව අංකනය කළ යුතුය. මුළු පිටු සංඛ්‍යාව ප්‍රධාන අයදුම්පතෙහි දකුණු පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

### 3.1 අයදුම්පත සමග අමුණා එවිය යුතු ලිපි ලේඛන පහත සඳහන් වේ.

- නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සත්‍ය බවට සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්.

  (අ) සීමිත වගකීම් සහිත සමාගම් - සාංගමික සංස්ථාපත්‍රය

  (ආ) වෙනත් ආයතන - ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය

**(2015 ජනවාරි 1 දින හෝ ඊට පෙර ලියාපදිංචි වී නොමැති ආයතන මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි. )**

- විදේශ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම දේශීය නියෝජිතයන් මගින් සිදු කිරීමේදී ප්‍රධාන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් අත්සන් කරන ලදුව අදාළ රටෙහි නීතිඥවරයෙකු විසින් හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සත්‍ය බවට සහතික කරන ලද ඇටෝර්නි බලයෙහි මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය. (මුල්පිටපත ආපසු අවශ්‍ය නම් එහි පිටපතක් සමග ඉල්ලීමක් ඉදිරිපත්කරන්න) මෙම ඇටෝර්නි බලයෙහි වලංගු කාලසීමාට පැහැදිළිව සඳහන් කළ යුතු අතර ඒ කාල සීමාවට 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා කාල පරිච්ඡේදය ඇතුළත් විය යුතුය. ෆැක්ස්, ටෙලෙක්ස් , ස්කෑන් හෝ වෙනත් ක්‍රමවේද යටතේ එවනු ලබන ඇටොර්නි බලපත්‍ර පිළිගනු නොලැබේ.
- සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා නිෂ්පාදකයා නොවන අවස්ථාවේදී සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා බලයලත්, ගනුදෙනුකරු හෝ බෙදාහරින්නා වන බවට නිෂ්පාදකයා විසින් ලිඛිතව සහතික කළ යුතුය.
- බැංකු ගිණුම සනාථ කෙරෙන ලිපියක්.
  (බැංකු ගිණුම ආරම්භ කරන ලද දින සිට අයදුම්කරු විසින් ජංගම ගිණුම පවත්වාගෙන යන බව සහ බැංකුකරුවන්ගේ නිර්දේශය)

- **S97** කාණ්ඩයට අදාල සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් වැඩ සඳහා ඉල්ලුම්කරන කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (සීඅයිඩීඒ) කුමන කාණ්ඩයක් යටතේ අවසන්වරට (2014/2015) ලියාපදිංචි වී ඇත්ද යන්න තහවුරු කිරීම සඳහා එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.

- **කාණ්ඩ ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල්පිටපත (ලංකා බැංකුව මගින් නිකුත් කරන ලද) අනිවාර්යයෙන් ඇමිණිය යුතුය.**

4. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවශ්‍ය සියලු ලිපි ලේඛන ද **ආවරණ ලිපියක්** සහිතව පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි 2015 ඔක්තෝබර් 16 දිනට පෙර ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය.

**ප්‍රධාන ගණකාධිකාරි**
**ආරක්ෂක අමාත්‍යාංශය**
**15 / 5 , බාලදක්ෂ මාවත**
**කොළඹ 03.**

දේශීය සැපයුම්කරුවන්ට අදාළව අයදුම්පත බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ **" සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2016 (දේශීය) "** යනුවෙන් සඳහන් කළ යුතු අතර විදේශ සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ දේශීය නියෝජිතයින් **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2016 (විදේශීය) "** යනුවෙන් සඳහන් කළ යුතුය. අතින් භාරදෙනු ලබන අයදුම්පත් <u>පිළිනොගන්නා අතර</u> තැපැලේදී සිදුවන ප්‍රමාදයකට ආරක්ෂක අමාත්‍යාංශයේ කිසිදු වගකීමක් නොමැත.

## <u>අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්</u>

5. එක් එක් කාණ්ඩය සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 1500/- ක් (රුපියල් එක්දහස් පන්සීයක් ) ගාස්තුවක් අය කෙරෙන අතර විදේශ අයදුම්කරුවන්ගෙන් (දේශීය නියෝජිතයන් නොමැතිවිට) මේ සඳහා අය කෙරෙන ගාස්තුව ඇමරිකානු ඩොලර් 15 ක් වනු ඇත. දේශීය අයදුම්කරුවකු (බොහෝ විට දේශීය නියෝජිතයකු) එක් ප්‍රධාන ආයතනයකට වැඩියෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරන්නේ නම් එබඳු එක් එක් ප්‍රධානියා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය. ලංකා බැංකුවේ ටැප්‍රොබේන් ශාඛාවේ අංක 7040119 දරණ ගිණුමට බැරවන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් කාණ්ඩ ගාස්තු මුදල් ගෙවිය හැකිය. විදේශීය සැපයුම්කරුවන්හට (දේශීය නියෝජිතයන් නොමැතිවිට) කාණ්ඩ ගාස්තු ගෙවීම එක් කාණ්ඩයක් යටතේ ලියාපදිංචි වීම සඳහා ඇමරිකානු ඩොලර් 15 ක් වශයෙන් SWIFT CODE භාවිතයෙන් ඕනෑම රටක ඕනෑම බැංකුවකින් ලංකා බැංකුව වෙත පහත ආකාරයට මුදල් ගෙවිය හැකිය.

Swift No - BCEYLKLX
Branch Code - 747
Account No - 7040119

6. දේශීය සැපයුම්කරුවන් පහත සඳහන් අකෘතිය ආකාරයට මුදල් තැන්පතු පත්‍රිකාව පුරවා කාණ්ඩ ගාස්තු ගෙවිය යුතු වේ.

**සැ. යු. :-** **බැංකුවට කාණ්ඩ ගාස්තු ගෙවන විට ඔබගේ <u>ආයතනයේ නම</u> හා ගෙවන <u>කාරණය</u> බැංකුවේ මුදල් භාරගන්නා නිලධාරියා ලවා අනිවාර්යෙන්ම පරිගණකයේ සටහන් කරගත යුතුයි. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට ඉඩඇත.**


BANK OF CEYLON
BOC
Bankers to the Nation
BOC/Supp/S 131685

මුදල් තැන්පතු පත්‍රිකාව பண வைப்புச் சீட்டு Cash Deposit Slip

දිනය / திகதி / Date: 2015

ගිණුම් / කාඩ්පත් අංකය கணக்கு/அட்டை இலக்கம் Account / Card Number: 7040119

ගිණුම් / කාඩ්පත් හිමියාගේ නම සහ ලිපිනය : கணக்கு/அட்டை வைத்திருப்பவரின் பெயரும் முகவரியும் : Account / Card Holder's Name and Address : ආරක්ෂක අමාත්‍යාංශය 15/5, බාලදක්ෂ මාවත කොළඹ 03.

ගිණුම් / කාඩ්පත් හිමියා නොමැතිව වෙනත් පාර්ශවයක් විසින් කරන රු. 200,000ට වැඩි මුදල් තැන්පතු සඳහා
கணக்குரிமையாளர்/அட்டை வைத்திருப்பவர் அல்லாது மற்றவர்கள் ரூபா. 200,000/-க்கு மேல் பணவைப்புச் செய்பவை
For cash deposits above Rs. 200,000 deposited by Person other than A/C Holder/Card Holder

Depositor's Name and Address: ගාලුපාර, කොළඹ.

N.I.C / P.P / D.L No.:

Telephone No :

Purpose of Deposit : කාණ්ඩ ගාස්තු - 2016

Ref No.

Depositor's Signature

Valid Computer Print or Authorised Signature

| Notes | Rs. | Cts. |
|---|---|---|
| 5000 /- | | |
| 2000 /- | | |
| 1000 /- | | |
| 500 /- | | |
| 200 /- | | |
| 100 /- | | |
| 50 /- | | |
| 20 /- | | |
| 10 /- | | |
| Coins | | |
| Total | 1 500 /- | |

Credit 1-2
Form No : 70175
GRAPHIC SYSTEMS - B
Validation checked
Signature

7. 2015.01.01 දින සිට ක්‍රියාත්මකවන වැට්බදු සංශෝධිත පණත යටතේ ලියාපදිංචි වී ලබාගත් වැට්බදු සහතිකයේ පිටපතක් ඉදිරිපත්කල යුතුවේ. එම නව සක්‍රීය වැට්බදු අංකය අමාත්‍යාංශය විසින් පත්කරන ලද විශේෂ මණ්ඩලයක් මගින් පරීක්ෂා කරනු ලබන අතර සාවද්‍ය වැට් අංක ලබා දී ඇති සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය කිසිම දැනුම්දීමක් නොමැතිව අවලංගු කරනු ලැබේ.

8. ප්‍රශ්නයක් ඉදිරියෙහි ඊට උචිත ආකාරයට '' ඔව් / නැත '' යන්න, පැහැර හැරීමකින් තොරව කපා දමන්න.

9. කරුණාකර අයදුම්කරුට අදාළ නොවන කවර හෝ අයිතමයක් ඉදිරියෙන් "අදාළ නොවේ" යන්න සඳහන් කරන්න.

10. ලියාපදිංචි කිරීමෙන් පසුව යම් සමාගමක (දේශීය හෝ විදේශීය) තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදු වුවහොත්, එම ඉල්ලීම සළකා බලනු ලබනුයේ එම ඉල්ලීම සමග එකී සංශෝධනයට සම්බන්ධ අදාළ සමාගම (දේශීය හෝ විදේශීය) මගින් නිකුත් කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණි.

11. ලියාපදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ හෝ **<u>කාණ්ඩ වර්ගයෙහි</u>** කිසිදු වෙනසක් සිදු කළ නොහැකි බව හා කාණ්ඩ අතර මාරුකිරීම් ද සිදුනොකරන බව සලකන්න.

12. අයදුම්කරුගේ යම් ප්‍රමාදදෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය වගකීම භාරගනු නොලැබේ.

13. 2016 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ වැඩිදුර තොරතුරු අවශ්‍ය වුවහොත් පහත සඳහන් නිලධාරීන් අමතන්න.

**ගණකාධිකාරී (සැපයීම් හා අලාභහානි)**

දුරකථන අංක - 001 2447459
011 3030736 , හෝ 011 2430860 / 79 - දිගුව 323
(කාර්යාල වේලාවන් තුළ පමණි)

ඊ-මේල් - supply@defence.lk

14. රජයේ ප්‍රසම්පාදන උපදෙස් 2006 (භාණ්ඩ සහ වැඩ) මත අංක 8.11.5 ඈ දරණ වගන්තියේ උපදෙස් ප්‍රකාරව කොන්දේසි පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවෙහි නම් සඳහන් සැපයුම්කරුවන්ට ලියාපදිංචි වීම සඳහා අවසර නොලැබේ.

15. මිල ගණන් ඉදිරිපත් කළ පසු සැපයීම සඳහා අවශ්‍ය පරිදි තොග තබා ගැනීම සැපයුම්කරු විසින් කළ යුතු අතර, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ලියාපදිචි වන අවස්ථාවේදි එක් මසක ණය පහසුකම් සැපයීමට සියලු සැපයුම්කරුවන් ස්වයංක්‍රීයවම එකඟ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

16. සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සීමිත මිල ගණන් කැඳවනු ලැබේ. එසේ වුවද අවශ්‍ය අවස්ථාවන්හිදී සැපයුම්කරුවන් තෝරා ගැනීමේ සම්පූර්ණ අයිතිය ආරක්ෂක අමාත්‍යාංශය සතුවේ.

17. ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් සියලු අයදුම්පත් සලකා බලන අතර, අවශ්‍ය සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ලියා පදිංචි කෙරේ. අවශ්‍ය සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කොට නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18. මිල ගණන් ඉල්ලා සිටි අවස්ථාවක වාර හතරක් තුල මිල ගණන් ඉදිරිපත් කිරීමට හා මිල ගණන් ලබා දීමට නොහැකි බව (“No Quote”) දැක්වීමට අපොහොසත් වන හෝ ඇණවුමක් නියමිත වේලාවටම ක්‍රියාත්මක කළ නොහැකි හෝ ඉල්ලා සිටි අවස්ථාවක නියැදි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ සැපයුම් පිරිවිතරයන්ට අනුකූල නොවන හෝ අනුමත නියැදියට වෙනස් සැපයුම් ඉදිරිපත් කරන හෝ සැපයුම්කරුගේ ලියාපදිංචිය දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ඇත.

19. පළාත් මට්ටමින් භාණ්ඩ හා සේවා සැපයිය හැකි ප්‍රාදේශීය සැපයුම්කරුවන් ගේ නාමලේඛනයක් ආරක්ෂක අමාත්‍යාංශය විසින් වෙනමම පවත්වා ගෙන යනු ඇත. ඒ සඳහා විස්තරාත්මක කාණ්ඩ වෙන් කොට ඇති අතර ඉල්ලුම්කරුවන් අනිවාර්යයෙන්ම අදාළ පළාතේ තම වෙළඳ ආයතනය ලියාපදිංචි කර තිබිය යුතුය.

20. දැනට 2015 වර්ෂය සඳහා පවත්වා ගෙන යනු ලබන සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ගේ ලියා පදිංචි ලේඛනය , 2016 වර්ෂයට අදාල සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය නිකුත් කල පසු අවලංගු වේ.

21. 2016 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

එස්.එම්. ජයසිංහ
ගණකාධිකාරී (සැපයීම් හා අලාභහානි)

අත්.කළේ බී.එම්.යූ.ඩී. බස්නායක
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය වෙ/